# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය
த. பெ.இ
2171635
Po.Box No
10120

ෆැක්ස්
தொலைநகல
Fax
011-

දුරකථන
தொலைபேசி
Telephone
011-2887973
(HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site
www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail
dir.media@police.gov.lk


මගේ අංකය
எனது இலக்கம்
My NO
1710/ 2024

ඔබේ අංකය
உமது இலக்கம்
Your No
/ 2024

දිනය
திக
Date
14/11/2024
පැය 0530

## මාධ්‍ය නිවේදනය

**01. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකාරියක් සහ සැකකරුවෙකු අත්අඩංගුවට - වාද්දුව පොලිස් ස්ථානය.**

2024.11.13 වන දින රාත්‍රී කාලයේ වාද්දුව පොලිස් වසමේ හෝටල් මාර්ගයේදී හා සනත් පෙරේරා මාවතේදී වාද්දුව පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරු මත වැටලීම් 02 ක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 200** ක් සන්තකයේ තබාගෙන සිටි සැකකාරියක් සහ **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 400** ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකාරිය වයස අවුරුදු 27 ක් වන පානදුර ප්‍රදේශයේ හා සැකකරු වයස අවුරුදු 25 ක් වන වාද්දුව ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

වාද්දුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. අකුණු සැර වැදී පුද්ගලයෙකු මියයාම - මැදවච්චිය පොලිස් වසම.**

2024.11.13 වන දින සවස් කාලයේදී මැදවච්චිය පොලිස් වසමේ දිවුල්වැව ප්‍රදේශයේ කුඹුරු වැඩ කරමින් සිටි පුද්ගලයෙකු අකුණු සැර වැදී මැදවච්චිය රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇති බවට මැදවච්චිය පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමර්ශනයක් ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 47 ක් වූ කුලික්කඩ, මැදවච්චිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය අනුරාධපුර රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. මැදවච්චිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**03. මාරක රිය අනතුරක් - මාවතගම පොලිස් වසම.**

2024.11.13 වන දින රාත්‍රී කාලයේ මාවතගම පොලිස් වසමේ කුරුණෑගල මහනුවර මාර්ගයේ බෝයගොඩ ප්‍රදේශයේදී මහනුවර දෙස සිට කුරුණෑගල දෙසට ධාවනය වූ වාහනයක පදික පුද්ගලයෙකු ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් පදික පුද්ගලයා එම ස්ථානයේදීම මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 34 ක් වූ උඩකොට්ටමුල්ල, වෑඋඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය කුරුණෑගල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුර සිදුකළ සැකකරු පලා ගොස් ඇති අතර, අත්අඩංගුවට ගැනීම සඳහා මාවතගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**04. මාරක රිය අනතුරක් - කිරිබත්ගොඩ පොලිස් වසම.**

2024.11.13 වන දින සවස් කාලයේ කිරිබත්ගොඩ පොලිස් වසමේ තැඹිලිගස්මුල්ල ප්‍රදේශයේ අතුරු මාර්ගයක සිට මාකොළ දෙසට ධාවනය වූ යතුරු පැදියක් පැදිකරුට පාලනය කර ගත නොහැකිව මාර්ගයෙන් ඉවතට පැන විදුලි රැහැන් කණුවක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ යතුරු පැදිකරු කිරිබත්ගොඩ රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 18 ක් වූ මහර, කඩවත ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය කිරිබත්ගොඩ රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. කිරිබත්ගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**05. මාරක රිය අනතුරක් - වාකරේ පොලිස් වසම.**

2024.11.13 වන දින සවස් කාලයේ වාකරේ පොලිස් වසමේ මඩකලපුව ත්‍රිකුණාමලය මාර්ගයේ කණ්ඩල්අඩි ප්‍රදේශයේදී ත්‍රිකුණාමලය දෙස සිට වාලච්චේන දෙසට ධාවනය වූ යතුරු පැදියක් පාපැදියක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පැදිකරු සහ පාපැදිකරු වාලච්චේන රෝහලට ඇතුලත් කිරීමේදී පාපැදිකරු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 56 ක් වූ පුලියන්කණ්ඩල්අඩි, වාකරේ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය වාලච්චේන රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. වාකරේ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**06. මාරක රිය අනතුරක් - ගලේවෙල පොලිස් වසම.**

2024.11.13 වන දින සවස් කාලයේ ගලේවෙල පොලිස් වසමේ අඹේපුස්ස ත්‍රිකුණාමලය මාර්ගයේ තොළඹුගොල්ල ප්‍රදේශයේදී කුරුණෑගල දෙස සිට දඹුල්ල දෙසට ධාවනය වූ යතුරු පැදියක මාර්ගය හරහා ගමන්කළ පදික කාන්තාවක් ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් පදික කාන්තාව, පැදිකරු සහ පසුපැදිකරු තුවාල ලබා ගලේවෙල රෝහලට ඇතුලත් කර ඇති අතර, බරපතල තුවාල ලබා සිටි පදික කාන්තාව දඹුල්ල රෝහලට මාරු කර යවා ප්‍රතිකාර ලබමින් සිටියදී මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 66 ක් වූ තොළඹුගොල්ල, ගලේවෙල ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීරය දඹුල්ල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. ගලේවෙල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**07. මාරක රිය අනතුරක් - ඇහැලියගොඩ පොලිස් වසම.**

2024.11.13 වන දින රාත්‍රී කාලයේ ඇහැලියගොඩ පොලිස් වසමේ කොළඹ රත්නපුර මාර්ගයේ පහල තලාවිටිය ප්‍රදේශයේදී ඇහැලියගොඩ දෙස සිට කුරුවිට දෙසට ධාවනය වූ යතුරු පැදියක් ලොරි රථයකට ඉස්සර කිරීමට යාමේදී ඉදිරියෙන් පැමිණි කන්ටේනර් රථයක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ යතුරු පැදිකරු ඇහැලියගොඩ රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 28 ක් වූ දවිලගල, කලවාන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය ඇහැලියගොඩ රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුර සම්බන්ධයෙන් කන්ටේනර් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. ඇහැලියගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**